**සී/ස ලංකා නැව් සංස්ථාව**
**(වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය )**

# ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ලේකම් තනතුර (සාමාන්‍යාධිකාරී සඳහා) - JM 1-2, GR. II ( ඇබෑර්තු 01)

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ලබාගත් උපාධියක්

**සහ**

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මඟින් පිළිගනු ලබන ආයතනයක් විසින් රහස්‍ය ලේකම්වරුන් සඳහා පවත්වනු ලබන සය (06) මසකට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම

**හෝ**

2. ශ්‍රී ලංකා වරලත් සමාගම් ලේකම්වරුන්ගේ ආයතනයේ අවසාන විභාගය සම්පූර්ණ කර තිබීම

**සහ**

ලේකම්වරයෙක් ලෙස වසර පහක (05) පළපුරුද්ද

**වෙනත් සුදුසුකම් :**

පරිගණක සාක්ෂරතාව පිළිබඳ ප්‍රවීණත්වය

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2 හෝ 3) :**

1. ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්

2. ක්ෂේත්‍රයට අදාළව කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) MA (1-2) ශ්‍රේණිය (II) කාණ්ඩයේ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. ක්ෂේත්‍රයට අදාලව ආශ්‍රිත නිළධාරි (MA-3) කාණ්ඩය තුළ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සියලුම අභ්‍යන්තර සහ බාහිර අයදුම්කරුවන් පහත දැක්වෙන සුදුසුකම් නිර්ණායකයන් සම්පූර්ණ කර තිබිය යුතුය.

1. ලඝුලේඛනය මිනිත්තුවට වචන 90 සහ යතුරුලියනය මිනිත්තුවට වචන 40 වෘත්තීය පරීක්ෂණය සමත්වීම

2. අ.පො.ස. (සා/පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් තිබීම

වැටුප් පරිමාණය : JM 1-2 – 2016 : රු. (43,355 – 10 x 755 – 18 x 1,135 – 71,335) 2024/01/01 දිනට වැටුප අනුව, (JM 1-2), II ශ්‍රේණියේ මූලික වැටුප රු. 43,355/- ක් වේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත සියළුම අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.

## ආශ්‍රීත නිලධාරි තනතුර - MA 3, GR. III (ඇබෑර්තු 03)

**<u>ආශ්‍රීත නිලධාරි (වාණිජ්‍ය අංශයන් සඳහා)</u>**

**බාහිර අපේක්ෂකයින්:**

**<u>අධ්‍යාපන සුදුසුකම්</u>:**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක තනතුරට අදාල වන ව්‍යාපාර කළමනාකරණය/ විද්‍යාව/වාණිජ්‍ය/අලෙවිකරණය/නාවික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය

**වැටුප් පරිමාණය :** MA-3 – 2016 : රු. (32,200-10×445-11×660-10×730-5×750-54,960)
2024/01/01 දිනට වැටුප අනුව, MA -3 කාණ්ඩයේ III ශ්‍රේණියේ මූලික වැටුප රු. 32, 200/- ක් වේ.

ඉහත වැටුප ට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත සියලුම අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

## කළමනාකාර සහකාර තනතුර - MA 1-2, GR. III (ඇබෑර්තු 16)

**බාහිර අපේක්ෂකයින්:**

**<u>අධ්‍යාපන සුදුසුකම්</u>:**

a) අ. පො. ස. (සා/පෙළ) විභාගය එකවර විෂයන් හයකින් සමත් වී තිබිය යුතු අතර එම විෂයන් අතරින් පහත දැක්වෙන විෂයන් ද ඇතුළුව විෂයන් 4ක් සඳහා සම්මාන සමාර්ථ තිබිය යුතුය.
   I. සිංහල/ දෙමළ
   II. ගණිතය

b) අ. පො.ස. (උ.පෙළ) විභාගය අවම වශයෙන් විෂයන් 03 කින් සමත් විය යුතුය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

**<u>අනෙකුත් සුදුසුකම්</u>**
පරිගණක සාක්ෂරතාව පිළිබඳ නිපුණතාවය

**අභ්‍යන්තර අපේක්ෂකයින් :** ප්‍රාථමික අදියර(Primary Level) - පුහුණු - නුපුහුණු යන කාණ්ඩ වල සේවකයන් අතරින් පහත දැක්වෙන සුදුසුකම් ලාභීන් මේ තනතුර සඳහා අයදුම් කිරීම සුදුසු වේ.

**<u>අධ්‍යාපන සුදුසුකම් :</u>**

අ.පො.ස.(සා.පෙළ) විභාගය එකවර විෂයන් හයකින් සමත් වී තිබිය යුතු අතර එම විෂයන් අතරින් පහත දැක්වෙන විෂයන්ද ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ තිබිය යුතුය.

I. සිංහල හෝ දෙමළ
II. ගණිතය

**වෙනත් සුදුසුකම් :**

ඉහත රැකියා කාණ්ඩය යටතේ සංස්ථාවේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 5කසතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**සටහන:** ස්ථිර තනතුරකට පත් කිරිමට පෙර, සපුරා ඇති කිසියම් සේවා කාලයක් හෝ ඕනෑම තනතුරක ස්ථිර පදනමේ තනතුරකට පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැපිරිය යුතු පුහුණුවීම් කාලයක් හෝ අනියම්/ තාවකාලික පදනමේ කිසියම් සේවා කාලයක් ඉහත සඳහන් කොට ඇති වසර 5ක සේවා කාල සීමාව තුලට ගණන් නො ගත යුතුය.

**කළමනාකාර සහකාර (වාප්පු) තනතුර - MA 1-2, GR. III (ඇබෑර්තු 01)**

ඉහත සඳහන් කළමනාකරණ සහකාර තනතුර සඳහා බාහිර හා අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ වන්නාවූ සුදුසුකම් හා පළපුරුද්ද මෙම තනතුර සඳහා ද අදාළ වන අතර, ඊට අමතරව පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛත්වය ලබා දේ.

a) අවම වශයෙන් වසරක පළපුරුද්දක් සහිත රේගු නිශ්කාෂණ සහතිකය (CHA) සතු වීම.
b) වලංගු මෝටර් සයිකල් බලපත්‍රයක් තිබීම.
c) SLPA බලපත්‍රයක් (A හෝ B ශ්‍රේණිය) තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**වැටුප් පරිමාණය:** MA 1-2, 2016- රු. (27,910- 10× 300-7× 350- 12×600- 12×710-49,080).

2024/01/01 දිනට වැටුප අනුව, (MA 1:2) කාණ්ඩයේ III ශ්‍රේණියේ මූලික වැටුප රු. 27,910/- ක් වේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත සියළුම අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

## රියදුරු තනතුර - PL 3, GR. III (ඇබෑර්තු 01)

<u>බාහිර අපේක්ෂකයින් සඳහා සුදුසුකම්</u>

| | |
|---|---|
| <u>අධ්‍යාපනික</u> | අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි/ ගණිතය විෂයන් 6ක් සමත් ව තිබීම. |
| | සහ |
| <u>වෘත්තීය</u> | බර වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් සහ පිළිගත් ආයතනයක බර වාහන පැදවීමේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද තිබීම. |

<u>අභ්‍යන්තර අපේක්ෂකයින්</u>

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබා තිබීම (අපේක්ෂිත ප්‍රවීණතාවය පැහැදිලිව සඳහන් විය යුතුය) සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සඳහා අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.

සහ

ප්‍රාථමික නුපුහුණු (PL1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කිරීම.

වැටුප් පරිමාණය: PL 3- 2016- රු. (26,290- 10× 270-10× 300-10×330-12×350-39,490)

2024/01/01 දිනට වැටුප අනුව තෝරාගත් අපේක්ෂකයා (PL - 3) කාණ්ඩයේ, III ශ්‍රේණියේ ආරම්භක වැටුප රු. 26,290/- තබනු ලැබේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත සියළුම අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

**<u>සියලුම තනතුරු සඳහා පොදු කොන්දේසි</u>**

| | |
|---|---|
| **වයස් සීමාව:** | වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ. |
| **බඳවාගැනීමේ ක්‍රමවේදය :** | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| **පරිවාස කාලය :** | බාහිර අයදුම්කරුවන් සඳහා වසර 03 ක් වන අතර අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වසරකි. |

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ. / සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය

2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකල වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාල පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. සහනශීලී නියමයන් මත වාහන ණය

## පොදු උපදෙස්

- සියලුම අයදුම්පත් තමා විසින් සත්‍ය බවට සහතික කළ අධ්‍යාපන / වෘත්තීය සහතිකපත්වල පිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපෑලෙන් ජනවාරි මස 15 වන දින හෝ ඊට පෙර සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, අංක 27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** වෙත ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පතෙහි සහ එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.

- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.

- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

---


**සභාපති**

**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**

**අංක 27,MICH ගොඩනැගිල්ල**

**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**

**කොළඹ 01**

වැඩි විස්තර සඳහා- **(+94) 011 2 497 800, 258/251** දුරකථන දිගුව, මානව සම්පත් අංශය


දිනය: **2024.01.02**